## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2017ජනවාරි මස 01 වන දා සිට 2017 දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාලය තුළදී නිම කරන ලද කාර්යයන්**

**1. උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අවස්ථාවන් පුළුල් කිරීම; විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවස්ථාව වැඩි කිරීම.**

1.1. වෛද්‍ය පීඨයන් දෙකක් ස්ථාපිත කිරීම.

2017 වර්ෂය තුළදී ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ හා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයන් දෙකක් ස්ථාපනය කිරීමත් සමඟ 2017 වර්ෂය ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ සුවිශේෂී වර්ෂයක් ලෙස ඉතිහාස ගත වන ලදී.

1.2. ඉහත කාල පරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වැඩි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව **-1180**

1.3.

- වෛද්‍ය විද්‍යාව - 160
- ඉංජිනේරු - 50
- කළමනාකරණය සහ වාණිජ්‍යය - 285
- තාක්ෂණවේදය - 225
- විද්‍යාව - 200
- මානව සහ සමාජ විද්‍යාව - 100
- තොරතුරු තාක්ෂණය - 80
- කෘෂි විද්‍යාව - 45
- නීතිය - 20
- පරිපූරක වෛද්‍ය - 05
- සිද්ධ වෛද්‍ය විද්‍යාව - 10

1.4. **නව පීඨ, අධ්‍යයනාංශ සහ උපාධි පාඨමාලා**

1.4.1. **අනුමත කළ නව පීඨ: 06**

| **අංකය** | **පීඨයේ නම** | **විශ්වවිද්‍යාලය** |
|---|---|---|
| 1. | සම සෞඛ්‍ය විද්‍යා පීඨය | රුහුණ විශ්වවිද්‍යාලය |
| 2. | වෛද්‍ය පීඨය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 3. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය |
| 4. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය |
| 5. | තාක්ෂණ පීඨය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය |
| 6. | තාක්ෂණික අධ්‍යයන පීඨය | ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |
| 7. | හෙද පීඨය | කොළඹ විශ්වවිද්‍යාලය |

**1.4.2. අනුමත කළ නව අධ්‍යයනාංශ : 39**

- කොළඹ විශ්වවිද්‍යාලය - 01
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය - 02
- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 05
- කැලණිය විශ්වවිද්‍යාලය - 03
- යාපනය විශ්වවිද්‍යාලය - 03
- රුහුණු විශ්වවිද්‍යාලය - 03
- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 02
- ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 09
- ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය - 05
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 02
- ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 02
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 02

**1.4.3. අනුමත කළ නව අධ්‍යයන පාඨමාලා :01**

- මූලාා ඉංජිනේරු විද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය

**1.4.4. අනුමත කළ නව උපාධි පාඨමාලා : 33 - ප්‍රථම උපාධි -18, පශ්චාත් උපාධි - 15**

- කොළඹ විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 01,පශ්චාත් උපාධි - 04
- පේරාදෙණිය විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 02,පශ්චාත් උපාධි - 01
- කැලණිය විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -01
- මොරටුව විශ්වවිද්‍යාලය - පශ්චාත් උපාධි - 02
- රුහුණු විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -01
- නැගෙනහිර විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -02
- අග්නිදිග විශ්වවිද්‍යාලය - පශ්චාත් උපාධි - 01
- රජරට විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -03
- වයඹ විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි -03
- සබරගමුව විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 02
- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - ප්‍රථම උපාධි - 03,පශ්චාත් උපාධි - 02
- කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක විද්‍යායතනය - පශ්චාත් උපාධි - 05

**2. විශ්වවිද්‍යාල ප්‍රවේශක්‍රියාවලිය සරල කිරීම, නවීකරණය සහ නියාමනය**

අ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන්ව සලකා බැලිය යුතු දිස්ත්‍රික්ක නිර්ණය කිරීමට අවශ්‍ය වන ඡන්දහිමි නාම ලේඛන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මැතිවරණ කොමිෂන් සභාව සමඟ එක්ව සුදුසු ක්‍රමවේදයක් සකස් කරන ලදී.

ආ. ඒ අනුව, සිසුන්ට ඔවුන්ගේ අයදුම්පත් සමඟ එවීම පිණිස ඡන්දහිමි නාම ලේඛන මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම තවදුරටත් අවශ්‍ය නොවන අතර එමගින්

සිය අයදුම්පත් කිසිදු ගැටලුවකින් හා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකි වේ.

ඇ.මෙම ක්‍රමය විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩි කිරීමට හේතු විය.

ඈ. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කරන සිසුන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් සකසා විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව හා විනිවිදභාවය වැඩි කිරීමට කටයුතු කරන ලදී.

**3. අ.පො.ස(උසස් පෙළ)විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සහ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීම අතර වූ කාලසීමාව අඩු කිරීම සඳහා වූ ජාතික අවශ්‍යතාව සපුරාලීම.**

වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රවේශ ක්‍රියාවලිය යටතේ සිසුන් විසින් අධ්‍යයන පාඨමාලාවන්ට දක්වන්නා වූ මනාපය සහ ඔවුන්ගේ කුසලතාව පදනම් කර ගෙන ඔවුන්ට උපාධි පාඨමාලා ලබා දෙන අතර,ඇතැම් සිසුන් ඒ සඳහා ලියාපදිංචි නොවීම හේතුවෙන් ඇතිවන සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව පුරවා ගැනීම සඳහා පුරප්පාඩු වට කිහිපයක් හරහා සිසුන් තෝරා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සිදු වේ.මෙසේ පුරප්පාඩු පිරවීමට ගත වන කාලය විශ්වවිද්‍යාල ආරම්භ කිරීම ප්‍රමාදවීමට හේතුවේ.

මෙම තත්වය පාලනය කිරීමට පහත දැක්වෙන පියවර අනුගමනය කළ අතර එමඟින් අ.පො.ස(උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීම හා විශ්වවිද්‍යාලවල විවිධ පාඨමාලාවලට තෝරා ගත් සිසුන්ගේ ලැයිස්තුව විශ්වවිද්‍යාලවලට නිකුත් කිරීම අතර කාල පරාසය මාස 5 කින් අඩු විය.

අ. විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට ලබා දුන් අවසන් දිනය නිකුත් වූ වහාම විශ්වවිද්‍යාලවල පවතින පුරප්පාඩු සංඛ්‍යාව හඳුනාගැනීමට නව යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදි.

ආ. සැලකිය යුතු පුරප්පාඩු ප්‍රමාණයක් සහිත අධ්‍යයන පාඨමාලා ඇති විශ්විද්‍යාලවල, උප කුලපතිවරුන්ගේ හා පීඨාධිපතිවරුන්ගේ එකඟතාව ලබා ගැනීමෙන් පසුව, එම පුරප්පාඩු පිරවීම කඩිනම් කිරීමට නව විධිවිධාන සකස් කරන ලදී.

ඇ. සිසුන් තමන් තේරී පත් වූ විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලාව පිළිබඳ සෑහීමකට පත් වන්නේ නම්, පුරප්පාඩු පිරවීමේදී මින් ඉදිරියට ඔවුන්ව සලකා බැලීමට අවශ්‍ය නොවන ඔවුන් විසින් සිය විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පතෙහි දැනට තේරී සිටින විශ්වවිද්‍යාල අධ්‍යන පාඨමාලාවට වඩා ඉහළ මනාපයක් දක්වා ඇති විශ්වවිද්‍යාලවල අධ්‍යයන පාඨමාලා, එම ලැයිස්තුවෙන් ඉවත් කිරීමට ඉඩ දෙන නව යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී.

ඈ. ඒ අනුව, සිසුන්ට තමන් විසින් ඉහළ මනාපයන් දක්වා ඇති විශ්වවිද්‍යාල පාඨමාලා සඳහා පුරප්පාඩු පිරවීමේදී තේරී පත් නොවී ඔවුන් මනාපය දක්වන විශ්වවිද්‍යාල අධ්‍යයන පාඨමාලාවේම රැඳී සිටීමට අවස්ථාව ලබා දී ඇත.මෙම පියවර මඟින් සිසුන් කැමැත්තක් නොදක්වන පාඨමාලා සඳහා තේරී පත්ව, ඒ සඳහා ලියාපදිංචි නොවීමේ ප්‍රවණතාවය අඩු වූ අතර පුරප්පාඩු පිරවීමේදී වැඩි පුරප්පාඩු ප්‍රමාණයක් පිරවීමට මෙය උපකාරී විය. 2015/2016 අධ්‍යයන වර්ෂය හා සැසඳීමේදී 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා වන බඳවා ගැනීම් අවසන් වන විට, පසු ගිය අවුරුද්දට වඩා 70% ක පමණ පුරප්පාඩු ප්‍රමාණයක් අඩු වීමට මෙය හේතු විය.

ඉ. එබැවින් විශ්වවිද්‍යාල තම අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර, ශිෂ්‍ය ලියාපදිංචි කටයුතු අවසන් කර තම අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට හැකි වන පරිදි ලියාපදිංචි සිසුන්ගේ

අවසාන ලැයිස්තුව විශ්වවිද්‍යාල වෙත යැවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැන් හැකියාව ඇත.

4. **කුසලතා නොගැලපීම නැති කිරීමට සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය රැකියා වෙළඳපලට ගැලපෙන ලෙස සකස් කිරීමට රාජ්‍ය විශ්වවිද්‍යාලවලට යෝජනා කළ හා හඳුන්වාදුන් නව ක්‍රියාමාර්ග**

අ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අදාළ නව උපාධි පාඨමාලා හඳුන්වාදීමට විශ්වවිද්‍යාල දිරිමත් කිරීමට හා ඒ සඳහා අරමුදල් ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව කටයුතු කර ඇත.

ආ. නව දැනුම සහ කුසලතා හඳුන්වාදීම තුළින් රටේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි දැනට පවතින මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උපාධි ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

ඇ.වර්තමාන විශ්වවිද්‍යාල ප්‍රවේශ නිර්ණායකවලට යටත්ව රාජ්‍ය විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවන සිසුන් හට නව අවස්ථාවක් නිර්මාණය කර දීම සඳහා රැකියා වෙළඳපලේ පවතින අවශ්‍යතා ඉලක්ක කර ගනිමින් පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මඟින් ගාස්තු ගෙවීමේ පදනම මත රැකියා පාදක කර ගත් තුන් අවුරුදු උපාධි වැඩසටහන් හඳුන්වාදීමට විශ්වවිද්‍යාලවලට අවස්ථාව ලබා දෙමින් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට තීරණය කරන ලදී. 2018 අයවැය කතාවේදී ද මෙම කාරණය සඳහන් කරන ලදී.

ඇ.රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අධ්‍යයන ප්‍රධානීන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව උපාධිධාරී රැකියාලාභීන් විශ්ලේෂණය කිරීමට සවිස්තරාත්මක සාක්ෂි ලබා ගැනීම සඳහා යුනෙස්කෝ අරමුදලින් අධ්‍යයනයක් (Tracer study) ආරම්භ කරන ලදී.

5. **විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය හා ශක්‍යතාවය ශක්තිමත් කිරීමට ගත් ක්‍රියාමාර්ග**

අ. විශ්වවිද්‍යාල පද්ධතියේ කාර්යසාධනය, **පර්යේෂණ** ප්‍රතිඵල මත පදනම් කරගනිමින් අන්තර්ජාතික දර්ශකයක් මඟින් විශ්වවිද්‍යාල සංවර්ධනයට එය යොදා ගැනීම සහ සේවකයන්ගේ හා ශිෂ්‍යයන්ගේ යහපත පිණිස ප්‍රතිලාභ (උත්පාදිත ආදායම) රඳවා ගැනීම හා යොදා ගැනීම තුළින් දිරිමත් කරන ලදී.

ආ.රාජ්‍ය විශ්වවිද්‍යාල මඟින් පිරිනමන උපාධි වැඩසටහන්වල අගය තීරණය කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ යාන්ත්‍රණයක් නිර්මාණය කරන ලදී.

6. **රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතියේ තත්ත්ව සහතිකකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම හා විධිමත් කිරීම.**

අ. ගරු උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගේ හා ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ මඟ පෙන්වීම යටතේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රාජ්‍ය හා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන තත්ත්ව සහතික කිරීම හා ප්‍රතීතනය කිරීම සඳහා නව ස්වාධීන තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන අධිකාරියක් ස්ථාපනය කිරීමට නව නීති කෙටුම්පතක් සකස් කරන ලදී.

ආ. මෙය ඉක්මනින් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අතර එමඟින් ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතිකකරණ හා ප්‍රතීතන පද්ධතිය වෙනස් වීම හා වැඩිදියුණු වීම සිදු වෙයි.

ඇ. රාජ්‍ය විශ්වවිද්‍යාල සඳහා අඛණ්ඩ තත්ත්ව සහතිකකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතිකකරණ අධ්‍යක්ෂක ධුරයක් ස්ථාපනය කරන ලද අතර 2017 වර්ෂය තුළදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා උපාධි පාඨමාලා පිළිබඳ තත්ත්ව සහතිකකරන විශ්ලේෂණ 42ක් සම්පූර්ණ කරන ලදී.

**7. විශ්වවිද්‍යාල- කාර්මික ව්‍යාපාර අතර සම්බන්ධතාවයන් වර්ධනය කිරීම.**

අ.ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සහයෝගය ඇතිව විශ්වවිද්‍යාල උපාධිධාරීන්ට සාර්ථක ව්‍යාපාර සැලසුම් කිරීම සඳහා ආරම්භක මූල්‍යාධාර ලබා දීමට “උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය ” ව්‍යවසායක සංවර්ධන වැඩසටහන හඳුන්වා දෙන ලදී.

**8. ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාවය හා සාධාරණත්වය, ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය වැලැක්වීම හා උසස් අධ්‍යාපනය සඳහා සුරක්ෂිත හා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට සහ විශ්වවිද්‍යාල තුළ නවකවදය අවම කිරීමට ගෙන ඇති පියවර.**

අ.පළමුවරට,රාජ්‍ය විශ්වවිද්‍යාලවලට සිසුන් පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී, දෙමව්පියන්/භාරකරුවන් සහ සිසුන් විසින් විශ්වවිද්‍යාලයේ සිටින කාලය තුළදී නවකවදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවල නිරත වීමේ ප්‍රතිවිපාක අවබෝධ කර ගත් බව සහතික කිරීම පිණිස, දිවුරුම් ප්‍රකාශයක් අත්සන් කිරීම සිදු කරන ලදී. 1998 නවකවද පනතට යටතේ,නවකවදයට වරදකරුවකු වීම, විශ්වවිද්‍යාලයෙන් නෙරපා දැමීමට සහ අවම වශයෙන් වසර 7 ක දැඩි දඬුවම් සහිතව සිරදඬුවම් විඳීමට සිදු වේ.

ආ.පහත දැක්වෙන පරිදි නවකවදය සහ ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය හා බැඳුනු පැමිණිලි විසඳීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලදී :

- අන්තර්ජාලය ඔස්සේ නවකවදය හා සම්බන්ධ පැමිණිලි ඉදිරිපත් කිරීමේ බිහිදොර(online portal)(www.ugc.ac.lk./rag)

- 24/7 ඇමතුම් මධ්‍යස්ථානය (0112 123700)

- නිශ්චිත ඊමේල් හැඳුනුම් (egginghelp@ugc.ac.lkසහ helpme@ugc.ac.lk )

- “හදිසි ආරක්ෂිත ජංගම යෙදුම”සඳහා ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය(ICTA) සමඟ එක්ව ප්‍රතිරූපක (prototype) හඳුන්වා දෙන ලදී.මෙය ඉතා කෙටි කලකදී ක්‍රියාත්මක කරනු ඇත.

- “විශ්වවිද්‍යාල තුළ නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිසුන් සඳහා තොරතුරු”යනුවෙන් විස්තර පත්‍රිකා සහ නවීකරණය කරන ලද පැමිණිලි ඉදිරිපත් කිරීමේ මාර්ගගත බිහිදොර වෙත අළුතින් පිවිසෙන්නන්ට, පිවිසීමේ ආකාරය හා සංසරණය කිරීම පිළිබඳ වීඩියෝ සජීවීකරණය.

- නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ දත්ත සමුදායන් (data bases) ස්ථාපනය කරන ලදී.

- නවකවදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ මාර්ගගත බිහිදොරක් (online portal)සකස් කිරීම.

- ඉහත (අ) වගන්තියෙහි සඳහන් කල පරිදි, මෙම නව අනිවාර්ය රීතිය පිළිබඳව සියලු සිසුන් දැනුවත් කිරීමපිණිස ශිෂ්‍යයන් හා දෙමාපියන් විසින් අත්සන් කරන ලද නවකවද විරෝධී දිවුරුම් පෙත්සම්, 1998 නවකවද පනතට අනුව විශ්වවිද්‍යාලවල ප්‍රචණ්ඩක්‍රියා හා නවකවද ක්‍රියාවල නිරතවීමේ ප්‍රතිවිපාක පිළිබඳ ඔවුන්ගේ දැනුවත් බවතහවුරු කිරීමේ සාක්ෂියක් ලෙස යොදා ගැනෙනු ඇත.

ඈ."විශ්වවිද්‍යාලවල නවකවද හිංසනය වැළැක්වීම සහ ඉවත් කිරීමට"නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා පොලිස් නිලධාරීන් ඇතුළු පිරිසක් සහිත බහු- අංශ කාර්ය බලකායක් පිහිටුවන ලදී.

ඇ. නවකවදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය හා බැඳුණු ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය උපාය මාර්ගික මැදිහත්වීම් සකස් කිරීමට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නවකවදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය හා බැඳුණු ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්තිය සහ එම සිද්ධීන් පිළිබඳ පර්යේෂණ ආරම්භ කරණ ලදී.

ඉ.විශ්වවිද්‍යාල සිසුන්ට හා කාර්ය මණ්ඩලයට "ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව/ සාධාරණත්වය කරා ගමන් කිරීම: යන මැයෙන් අන්තර් විශ්වවිද්‍යාලීය උළෙලක්" වාර්ෂික අන්තර් විශ්වවිද්‍යාලීය ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගුණාත්මකබව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ආරම්භ කරන ලදී.

ඊ. ස්ත්‍රී පුරුෂ සමාජභාවමය පිළිබඳ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ විශ්වවිද්‍යාල සමඟ නවකවදය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවමය හා බැඳුණු ප්‍රචණ්ඩත්වය පිළිබඳ සාකච්ඡා කිරීමට,විශ්වවිද්‍යාල පද්ධතියේ තිබෙන ස්ත්‍රී පුරුෂ සමාජභාවමයේ සමානාත්මතාව/සාධාරණත්ව පිළිබඳ කේන්ද්‍ර ජාලයක් ස්ථාපිත කරන ලදී.

උ. උසස් අධ්‍යාපනක්ෂේත්‍රයේ පවතින ස්ත්‍රී පුරුෂ සමජභාවමයේ තත්ත්වය පිළිබඳ අධ්‍යයනයකිරීම සඳහා පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට කටයුතු කර ඇත.

**9. උපාධිධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා කථනය, ලිවීම, සහ සන්නිවේදන හැකියාවන් වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන්සහ ඉංග්‍රීසි භාෂාව උගන්වන ගුරුවරුන්ගේ හැකියාවන් ගොඩනැංවීමට සහ පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අධ්‍යයනාංශ (ELTD) පිහිටුවීම ආරම්භ කරන ලදී.**

**10. උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ මඟ පෙන්වීම යටතේ ශිෂ්‍ය, අධ්‍යයන හා අනධ්‍යයන වෘත්තීය සංගම් සමඟ සමීප සංවාදයන් ගොඩනැගීම ආරම්භ කර ඇත.**

**11. විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ට විශ්වවිද්‍යාලවල ඉගෙනීමේ කටයුතු සඳහා ඇතුළත්වීමට ප්‍රථම, අන්තර්ජාලය හරහා ඉංග්‍රීසි සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ විෂය මාලාවක් හැදෑරීමට අවස්ථාව සලසා දීම සහ එය අවසන් කළ පසු ඒ සඳහා සහතිකයක් පිරි නැමීමට කටයුතු කර ඇත.**

**12. විශ්වවිද්‍යාල යටිතල පහසුකම් සංවර්ධනය**

- පූර්ව සායනික ගොඩනැගිල්ල, වෛද්‍ය පීඨය කොළඹ විශ්වවිද්‍යාලය රු.මිලියන 6,604
- තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය රු.මිලියන 2,087
- තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය රු.මිලියන2,640
- දේශන ශාලා සංකීර්ණය, විද්‍යා පීඨය , කැලණිය විශ්වවිද්‍යාලය රු.මිලියන 500
- ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශ ගොඩනැගිල්ල, මොරටුව විශ්වවිද්‍යාලය රු.මිලියන 439

- යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා වූ ගොඩනැගිල්ල රු.මිලියන700
- තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල යාපනය විශ්වවිද්‍යාලය රු.මිලියන 525
- රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා වූ තට්ටු 12ක ගොඩනැගිල්ල රු.මිලියන 1,179
- වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය රු.මිලියන 3,229.4
- වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන ගොඩනැගිල්ල රු.මිලියන 2,500
- ත්‍රිකුණාමලය මණ්ඩපය සඳහා වූ ශ්‍රවණාගාරය රු.මිලියන 784.8
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල නිවාස යෝජනා ක්‍රමය රු.මිලියන 414.7
- ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා වූ පුස්තකාල ගොඩනැගිල්ල රු.මිලියන 371.8
- ශ්‍රී ලංකා අග්නි දිග විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අධ්‍යනාංශය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය රු.මිලියන 451
- සෞන්දර්ය කළා විශ්වවිද්‍යාලය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය රු.මිලියන 775
- රුහුණ විශ්වවිද්‍යාලයේ තාක්ෂණ අධ්‍යනාංශය සඳහා වූ ගොඩනැගිලි සංකීර්ණය රු.මිලියන 693
- සිසුන් 23,200 ක් සඳහා නේවාසික පහසුකම් ලබා දීමට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ කාමර 100 කින් යුත් සිව් මහල් නේවාසිකාගාර 58ක් ඉදි කිරීම සඳහා රු.මිලියන 12,857ක මුදලක් ආයෝජනය කර තිබේ.

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

**2018.02.02**